## 239 බාලයන් මා වෙතට

බාලයන් මා වෙතට
එන්න ඉඩ දෙනුයි
ජේසු කී වදන් මා
මතකයට නැගේ

ජේසු සමිඳු නමට අපේ සිරස නමනවා
ජේසු සමිඳු හදට අපේ හද ඔසවනවා
ජේසු සමිඳු පෙමට අපේ පෙමඳ පුදනවා
ජේසු සමිඳු වෙතට අපේ දෙපා නගනවා

අපේ ගමන ජේසු වෙතට නැත වරදින්නේ
අපේ සිතැගි ජේසුටමයි අපි පවසන්නේ
අපේ හඬට ජේසු තුමන් නිති කන් දෙන්නේ
අපේ යැදුම නැත එතුමන් ඉවත දමන්නේ

කිතුණු ළමා අපේ උරුම නැති කරන්නෙපා
කිතුණු ළමා අපේ පැතුම් බොඳ කරන්නෙපා
කිතුණු ළමා අපේ සෙතට විත කරන්නෙපා
කිතුණු ළමා අපව මුලාවේ හෙළන්නෙපා